# රකුසු මුගලන්

කාශ්‍යප රජු ද බෞද්ධයකු වූ බව පැහැදිලි ය. ඒ වන විට ඇතැම් යක්‍ෂ ගෝත්‍රිකයන් බෞද්ධයන් වන්නට ඇත. හැරත් කාශ්‍යප රජු ධාතුසේන රජුගේ ද පුතු විය. එබැවින් ඔහු බෞද්ධ වීම කිසිසේත් පුදුමයක් නො වේ. කාශ්‍යප රජු පමණක් නොව එතුමාගේ දියණියන් දෙදෙනා ද බෞද්ධ වූ බව මහාවංසයෙන් ද පැහැදිලි වෙයි. එහෙත් සිංහල රාජ්‍යය පැහැර ගැනීම පිළිබඳ ව සිංහල භික්‍ෂූන් වහන්සේ ද ඇතුලු සිංහල බෞද්ධයන් කාශ්‍යප රජුට කිසිම සමාවක් නො දෙන්නට ඇත.

අප දැනට කලකට පෙර පැවසූ පරිදි කාශ්‍යප රජු යක්‍ෂ සම්ප්‍රදාය අනුව සිහිගිරිය කරවා ඇත. එහි උයන් ද පර්සියන් සම්ප්‍රදාය අනුව පවත්වාගෙන ගොස් ඇති බව නව කැණීම්වලින් පැහැදිලි වෙයි. බොහෝ කරුණු විමසා බැලූ කල පැහැදිලි වන්නේ සිහිගිරිය යක්‍ෂ සංස්කෘතිය සිහිකිරීම සඳහා කරවන ලද්දක් බව ය. සිංහලයන් විසින් අමතක කරනු ලැබ තිබූ යක්‍ෂ සංස්කෘතිය හා සම්ප්‍රදාය නැවත සිහිකිරීම සඳහා ඉතා අනර්ඝ ව උයන් චිත්‍ර සහිත ව සිහිගිරිය කරවා ඇති බව පෙනී යයි.

ඒ කිසිසේත් ම බියෙන් විසූ පුද්ගලයකුගේ නිර්මාණයක් විය නො හැකි ය. එහෙත් මුගලන් කුමරු ආපසු එන බව කාශ්‍යප රජු නොදැන සිටියා නො වේ. එසේ වුවත් රටේ ප්‍රමාණවත් බලයක් යක්‍ෂ ගෝත්‍රිකයන් විසින් අත් කරගෙන තිබූ බැවින් කාශ්‍යප රජුට බියවීමට කරුණු නො වීය. රජුට සෙනෙවියන් දාහක් සිටි බව මහාවංසහි ම කියැවෙන කරුණුවලින් සනාථ වෙයි. සෙනෙවියන් දහසක් යටතේ සෙබළුන් විශාල සංඛ්‍යාවක් සිටි බව ඉතා පැහැදිලි ය.

අවුරුදු දහඅටකට පසු රටට පැමිණි මුගලන් කුමරු සිංහලයන් විසින් හරසරින් පිළිගනු ලැබූ බවට සැකයක් නැත. භික්‍ෂූන් වහන්සේලා එකුමරුට ආශිර්වාද කළ බව ද පැහැදිලි ය. කාශ්‍යප රජු මුගලන් ට එරෙහි ව යුද්ධයට ගියේ ය. එය සිංහල ජාතිකයන් හා යක්‍ෂ ගෝත්‍රිකයන් අතර ඇති වු අවසන් ප්‍රධාන සටන යැයි අපි කියමු. ඉන් පෙර එවැනි සටනක් ඇති වූයේ මහසෙන් රජු දවස බව ද කිව හැකි ය. ඇතැම් විට එළාර ගැමුණු සටන ද සිංහලයන් හා බොහෝ යක්‍ෂ ගෝත්‍රියන් අතර සිදු වූ සටනක් විය හැකි ය. එළාර රජු පර්සියාවෙන් පැමිණෙන්නට ඇත්තේත් යක්‍ෂ ගෝත්‍රිකයන් සමග තිබූ සම්බන්ධකම් උඩ යැයි සිතිය හැකි ය.

එසේ පැමිණි එළාර රජුට යක්‍ෂ ගෝත්‍රිකයන් බොහෝ පිරිසක් ආධාර කර ඇති බව මහාවංස කතාවලින් පැහැදිලි වෙයි. එළාර රජුට අනුරාධපුරය එතරම් අපහසුවක් නැතිව යටත්කර ගැනීමට හැකි වීමේ රහස ද ඒ ආධාරය බව පැහැදිලි වෙයි. එසේ සිංහලයන් හා සිංහලයන් වීමට විරුද්ධ වූ යක්‍ෂ ගෝත්‍රිකයන් අතර විටින් විට පැවති ප්‍රධාන සටන් අවසන් වී ඇත්තේ කාශ්‍යප මුගලන් යුද්ධයෙන් පසුව බව වංසකතාවෙන් ම  පැහැදිලි වෙයි.

මුගලන් කුමරු ආපසු පැමිණීමෙන් පසුව ඇති වූ යුද්ධයෙන් කාශ්‍යප රජු පැරදී ඇත්තේ එතුමාගේ සේනාව එතුමා වැරදියට වටහා ගැනීම නිසා මිස මුගලන් කුමරුගේ හෝ ඔහුගේ සේනාවේ හෝ දක්‍ෂතාවක් නිසා නොවන බව පැහැදිලි ය. වංසකතාවට අනුව රජතුමා හමුදාව ගමන්කළ මගෙහි වූ බාධකයක් මගහැරීමට හැරුණු අවස්ථාවෙහි එතුමා පළා යන්නේ යැයි විශ්වාස කළ සේනාව එතුමා අතහැර ගොස් ඇත. මුගලන් කුමරු ලද අවස්ථාවෙන් ප්‍රයෝජන ගෙන කාශ්‍යප රජතුමා මරා දමා රාජ්‍යත්වයට පත් වී ඇත.

මුගලන් කුමරු රජවීමෙන් පසු මෙරට භීෂණ සමයක් උදා වී ඇත. රජතුමා කාශ්‍යප රජුගේ සෙනෙවියන් දාහක් මරා දැමූ බව මහාවංසයෙහි සඳහන් වෙයි. මේ සෙනෙවියන් සියල්ලම නොවේ නම් අති විශාල බහුතරයක් යක්‍ෂ ගෝත්‍රිකයන් වූ බවට සැකයක් තිබිය නො හැකි ය. එයට අමතරව මුගලන් රජු තමාට විරුද්ධ වූ වැසියන් ද ඝාතනය කර ඇත. මේ අය විශාල වශයෙන් ගතහොත් සිංහල ජාතියට ඇතුල් නොවූ යක්‍ෂ ගෝත්‍රිකයන් වන්නට ඇතැයි සිතිය හැකි ය. මුගලන් රජු කෙතරම් භීෂණයක් ඇති කෙළේ ද කිවහොත් ඔහුට රකුස් මුගලන් යනුවෙන් නමක් ද පටබැඳී ඇත.

© Prof. Nalin De Silva

රකුස් යන නම පටබැඳීම ගැන ද වචනයක් සඳහන් කළ යුතු ය. රාක්ෂසයෝ ද අර්ධ ෙ2වදිකයන් මෙරටට පැමිණීමට පෙර මෙහි වාසය කළ ජනවර්ගයක් වූහ. එමෙන් ම ආර්යයන් දඹදිවට පැමිණීමට පෙර එහි රාක්ෂසයන් සිටි බව පැහැදිලි ය. රාවණ රජු කොහේ වාසය කළ ද රාක්ෂස ගෝත්‍රයට අයත් විය. ඇතැමුනට අනුව රාක්ෂස වර්ගය යක්ෂ ගෝත්‍රිකයන්ගේ ආරක්ෂක භටයන්ගෙන් සමන්විත විය. වෙනත් වචනවලින් කිවහොත් රාක්ෂසයෝ යක්ෂ ගෝත්‍රිකයන්ගේ ආරක්ෂකයෝ වූහ. කෙසේ වෙතත් රාක්ෂසයන් යුද්ධ දක්ෂයන් වී ඇති බව පැහැදිලි ය. ඔවුන්ගෙන් දඹදිවට පැමිණි ආර්යයන්ට හිරිහැර සිදු වී ඇති බව ද පැහැදිලි ය. එහි ප්‍රතිඵලයක් ලෙස රාක්ෂකයන් සියලු දෙනා ම මහා භයානක පිරිසක් ලෙස, භීෂකයන් ලෙස, ආර්යයන් විසින් හඳුනාගෙන ලැබ ඇත.

රාක්ෂස යන නාමය එලෙස භීෂණය සමග පර්යාය වී හඳුනාගැනෙන්නට ඇත. රකුසා යන්න භීෂකයා යන අදහස ගෙන දෙන පදයක් ලෙස දඹදිව භාවිතා වී ඇති බව පැහැදිලි ය. ලංකාවට පැමිණි අර්ධ වෛදිකයනට ද රකුසා යන පදය එලෙස භීෂක සමග පර්යාය වී ඇති බව පැහැදිලි ය. අද පවා අප රාක්ෂස යන වචනය යොදා ගන්නේ භයානක යන අදහස ගෙන දෙන ආකාරයට ය. එහෙත් රාක්ෂස යන්නෙහි නෛසර්ගික ව ආරක්ෂකයා යන අර්ථය මිස භීෂක යන අර්ථය නොමැත. අප මෙවැනි යෙදුම් දැන්වත් නතර කළ යුතු ය.

කෙසේ වුවත් මුගලන් රජුට රකුස් නම පටබැඳී ඇත්තේ ඔහු මෙරට එකල භීෂණයක් දියත්කළ හේතුවෙනි. මේ භීෂණය යක්ෂ ගෝත්‍රිකයන්ට එරෙහිව දියත්කළ එකක් විය. එහෙත් ඕනෑම භීෂණයක් මෙන් ම පසු කාලයක දී භීෂණය අනෙක් ජනවර්ගවලට ද එරෙහි ව ක්‍රියාත්මක වන්නට ඇත. රකුස් යන නම මුගලන් රජුට පටබැඳෙන්නට ඇත්තේ භීෂණය සිංහලයන්ට ද එරෙහිව ක්‍රියාත්මක වීමට පටන්ගැනීමෙන් පසුව විය යුතු ය. කෙසේ වෙතත් යම් අවස්ථාවක භික්ෂූන් වහන්සේ මැදිහත් වී මුගලන් රජුගේ ක්‍රියා කලාපය වෙනස් කෙරී ඇත.

පසුව මුගලන් රජු වෙහෙර විහාර කරවා භික්ෂූන් වහන්සේ කමා කර ගත් බව මහාවංසයෙන් පැහැදිලි වෙයි. එතුමා සීගිරි ගල මුදුනෙහි ද විහාරයක් කර වී යැයි මහාවංසයෙහි සඳහන් වෙයි. ඇතැම් වත්මන් උගතුන්ට සීගිරිය මුල සිට ම බෞද්ධ විහාරයක් ලෙස හඳුනාගැනීමට තුඩු දී ඇත්තේ මේ විහාරය විය හැකි ය. මුගලන් රජුගෙන් පසුව ද සිංහල රජවරු සීගිරියෙහි බෞද්ධ සිද්ධස්ථාන ඉදිකරන්නට ඇත. සිහිගිරිය යක්ෂ ආධිපත්‍යයෙන් මුදා ගැනීම එහි එක් අරමුණක් වන්නට ඇත.

ඇතැම් විට සිහිගිරියෙහි සිංහ හස්ත (සිංහ කට) නිර්මාණය කරන්නට ඇත්තේ ද යක්ෂ ආධිපත්‍යයෙන් කැඩීමට විය හැකි ය. ඒ කිනම් කාලයක නිර්මාණය කෙරිණි ද යන්න පැහැදිලි නැත. එසේත් නැතහොත් ඒ කාශ්‍යප කුමරු රජවීමට පෙර සිට ම තිබි එකක් විය හැකි ය. කාශ්‍යප කුමරු තම අභිමානය සඳහා සිංහ කටින් ඇතුල්වීමට තීරණය කළා විය හැකි ය. මේ සියල්ල ගැන විධිමත් ගවේෂණයක් අවශ්‍ය වෙයි. එහෙත් සුසමාදර්ශය වෙනස් නොකර කෙරෙන ගවේෂණයක් ඵල දැරීමට බොහෝ කල් ගතවනු ඇත.

මුගලන් රජු මෙරට ඉතිහාසයෙහි සඳහන් විය යුත්තේ යක්ෂ ගෝත්‍රිකයන්ගේ දේශපාලන බලය නෑතිකළ තැනැත්තා ලෙස ය. ඔහු යක්ෂ ගෝත්‍රික සෙනෙවියන් මරණයට පත්කර වෙනත් ප්‍රධාන යක්ෂ ගෝත්‍රිකයන් ද විනාශ කරන්නට ඇත. මුගලන් රජුගෙන් පසුව යක්ෂ ගෝත්‍රිකයන් සිංහලයන්ට එරෙහිව කළ ප්‍රධාන සටනක් ගැන දැනගන්නට නැත. ඇතැම් යක්ෂ ගෝත්‍රිකයන් ඉන් පසුව ද තම අනන්‍යතාව රැකගැනීමට උත්සාහ කර ඇති බව පමණක් පැහැදිලි ය. මෑතක් වන තුරුම ඇතැම් ප්‍රදේශවල යක්ෂ ගෝත්‍රිකයන් තම යක්ෂ භාවය යම් ප්‍රමාණයකට වුවත් රැකගෙන ඇති නමුත් විසිවැනි සියවසේ අගභාගයේ සිට ඒ අසීරු කාර්යයක් වී ඇත.

අද යක්ෂ ගෝත්‍රිකයන්ට තබා සිංහලයන්ට ද තම අනන්‍යතාව රැකගැනීම ප්‍රශ්නයක් වී ඇත. ඒ දේශපාලන ආධිපත්‍යයක් පමණක් නිසා සිදුවන්නක් නොව සංස්කෘතික ආධිපත්‍යයක් ද නිසා කෙරෙන්නකි. මුගලන් රජුගේ කාලයෙහි සිදු වූයේ සිංහලයන්ගේ දේශපාලන ආධිපත්‍යයට එරෙහිව අවුරුදු සිය ගණණක් තිස්සේ ගොඩ නැගුණු යක්ෂ ගෝත්‍රික දේශපාලන අභියෝගයක් පරාජය කිරීම ය. ඕනෑම දේශපාලන ආධිපත්‍යයක් සමග යම් ප්‍රමාණයක වුව ද සංස්කෘතික ආධිපත්‍යයක් බද්ධ වී ඇත. අප රටේ අවුරුදු දහස් ගණනක ඉතිහාසය පමණක් නොව වෙනත් රටවල ඉතිහාසය ද අධ්‍යයනය කිරීමේ දී ඒ බව පෙනී යයි. එහෙත් සංස්කෘතික ආධිපත්‍යය වෙන ම ක්‍රියාත්මක වී ඇත්තේ බටහිරයන් යටතේ ය.

© Prof. Nalin De Silva

පැරණි යුගවල සිදු වී ඇත්තේ එක් පිරිසක දේශපාලන ආධිපත්‍යය තවත් පිරිසක් මත ක්‍රියාත්මක කිරීම ය. ඇතැම් විට ඒ පිරිස් දෙකම එකම සංස්කෘතියකට එකම ආර්ථික රටාවකට අයත් වූවන් වන්නට ඇත. එවැනි අවස්ථාවක හුදු දේශපාලන ආධිපත්‍යයෙහි පමණක් වෙනසක් සිදු වෙයි. එහෙත් ආධිපත්‍යය පිහිටුවන පිරිස වෙනත් සංස්කෘතියකට අයත් නම් ඇතැම් විට යම් ප්‍රමාණයක සංස්කෘතික ආධිපත්‍යයක් ද ඇතිවීම වැළැක්විය නො හැකි ය. එහෙත් ඇතැම් විට එහි ප්‍රතිලෝමය ද සිදුවන්නට ඉඩ ඇත. එනම් දේශපාලන ආධිපත්‍යය පිහිටුවූවන් වෙත ආධිපත්‍යයට යටවුවන්ගේ සංස්කෘතිය ආරෝපණය වීමක් ද සිදුවිය හැකි ය. දේශපාලන ආධිපත්‍යය සමග සංස්කෘතියෙහි දෙපැත්තට ම ඇතිවිය හැකි මේ වෙනස්කම් සංස්කෘතික ආරෝපණ ලෙස හැඳින්විය හැකි ය. ආර්යයන් දඹදිවට පැමිණීමෙන් පසුව දෙපැත්තට ම සංස්කෘතික ආරෝපණ සිදු වී ඇත.

එහෙත් බටහිර යටත්විජිතවාදය යනු හුදු දේශපාලන ආධිපත්‍යයක් පිහිටුවීම හා එයට අදාළව සංස්කෘතික ආරෝපණ සිදු වීම හෝ සිදු කිරීම හෝ නො වේ. එහි දී දැනුවත් ව සංස්කෘතික ආධිපත්‍යයක් ද පිහිටුවෙයි. බටහිර යටත්විජිතවාදය මෙතෙක් ලෝකයේ තිබූ යටත්විජිතවාදවලින් වෙනස් වන්නේ එබැවිනි. බටහිර යටත්විජිතවාදයෙහි එකිනෙකින් අන්‍යෝන්‍ය වශයෙන් බහිෂ්කාර නොවූ ආර්ථික, දේශපාලනික හා සංස්කෘතික සංරචක වෙයි. මුගලන් රජු කෙළේ යක්ෂ ගෝත්‍රිකයන් මත දේශපාලන ආධිපත්‍යයක් පිහිටුවීම පමණකි. ඒ සමග යම් යම් සංස්කෘතික ආරෝපණ දෙපැත්තට ම සිදුවන්නට ඇත. බටහිරයෝ දේශපාලන ආධිපත්‍යය පිහිටුවීමෙන් පමණක් සෑහීමකට පත් නොවූහ. ඔවුහු සංස්කෘතික ආධිපත්‍යයක් ද පිහිටුවූහ.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva